සුරාබදු තෑගි අරමුදල - **2017**

---

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1912 අංක 8 දරන සුරාබදු ආඥා පනතේ 58 ඒ වගන්තිය යටතේ පලකළ 1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනයේ 1(iii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම.

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටී ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින්වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තෑගි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

(i) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් අංක 2.1 මඟින් අරමුදලේ ගිණුම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කර ඇති බව වාර්තා කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි විධි විධානවලට පටහැනිව අරමුදලේ ගිණුම් මුදල් පදනම මත පිළියෙළ කර තිබුණි.

(ii) අරමුදල වෙනුවෙන් භාණ්ඩාගාරයේ පවතින ක්ෂය සංචිත අරමුදල් ගිණුමේ රු.44,185,902 ක් වූ ශේෂය ජංගම නොවන වත්කමක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

(i) වටිනාකම රු.47,134,000 ක් වූ ගොඩනැගිල්ල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස දක්වා තිබුණද එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම විගණන දිනය වූ 2018 මාර්තු 23 දක්වාම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ගොඩනැගිලි වෙනුවෙන් ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 64 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය ගණනය කිරීමේදී එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පිළිබදව සැලකිල්ලක් නොදක්වා ස්ථාවර වත්කම් ක්ෂය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සමථ ගාස්තු ලැබීම් වලින් සියයට 15 ක් ලෙස රු. 19,360,812 ක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද , ඒ සඳහා රු. 17,117,924 ක් පමණක් බැර කිරීම හේතුවෙන් තව දුරටත් බැර කළ යුතු රු. 2,242,888 ක වගකීම සඳහා ගිණුම්වල අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) අරමුදලට අදාලව **2017** දෙසැම්බර් මාසය සඳහා ලැබී තිබුණු රු. **22,288,232** ක සමථ ගාස්තු ලැබීම් සහ රු.**1,645,800** ක සිගරට් දඩ ආදායම් දෙපාර්තමේන්තු බැංකු ගිණුමට බැර වීම හේතුවෙන් එකතුව රු.**23,934,032** ක් වූ ආදායම අරමුදලේ ගිණුම් වලින් අත්හැරී තිබුණි.

**2.2.3** පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව සමථ ගාස්තු ලැබීම් සහ සමථ ගාස්තු ගෙවීම් ලෙස පිළිවෙළින් රු. **129,072,077** ක් සහ රු. **104,720,340** ක් දක්වා තිබූ අතර පරිගණක වාර්තා අනුව එම වටිනාකම් පිළිවෙළින් රු. **157,387,736** ක් සහ රු. **107,865,650** ක් වූයෙන් එම ශේෂයන්හි පිළිවෙළින් රු. **28,315,659** ක් සහ රු. **3,145,310** ක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

**2.2.4** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි **454 (1)** | මුදල් රෙගුලාසි විධි විධාන ප්‍රකාරව පොදු **44** ආකෘතිය පරිදි අරමුදලේ පිරිවැය රු.**38,810,560** ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ සම්බන්ධයෙන් බඩු ලේඛන පොතක් පවත්වා නොතිබුණි. |
| (ආ) **2002** නොවැම්බර් **28** දිනැති අංක අයිඑන්අයි/**2002/02** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**2.2.5** විගණනය සඳහා සාක්ෂි නොවීම.

ශුද්ධ වටිනාකම රු. **25,957,781** ක්වූ ස්ථාවර වත්කම් සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකෙරුණු අතර අරමුදල සතුව පවතින බවට වාර්තා වී ඇති රු.**47,134,000** ක් වටිනා ගොඩනැගිලි සම්බන්ධයෙන්ද ලේඛන ගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 28,646,537 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.32,263,375 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,616,838 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමථ ගාස්තු ලැබීම් ආදායම රු.**4,428,563** ක ප්‍රමාණයකින් හෙවත් සියයට **3** කින් අඩු වී තිබීම ඉහත අතිරික්තය පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

------------------

**1994** මාර්තු **04** දිනැති අංක **818** දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව පිහිටුවා ඇති සුරාබදු තෑගි අරමුදලේ පරමාර්ථයන් පහත සඳහන් පරිදි විය.

- ❖ සුරාබදු නිලධාරීන්, තොරතුරු සපයන්නන් සහ වෙනත් අයට තෑගි මුදල් ගෙවීම.
- ❖ පුහුණු කිරීම් සහ අධ්‍යාපනික කර්තව්‍යන්ට මුදල් සැපයීම.
- ❖ වර්ෂයකට රු.**50,000** ක සීමාවකට යටත්ව සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ක්‍රීඩා, විනෝද සහ සුභ සාධක වැඩවලට මුදල් සැපයීම.
- ❖ සුරාබදු දෙපාර්තමේන්තුවට අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ සහ වෙනත් දෑ මිලදී ගැනීම.
- ❖ ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීමක් කළ යුතු වෙනත් ක්‍රියාවලට තෑගි මුදල් ගෙවීම.
- ❖ විශේෂ රාජකාරීන් හෝ විශේෂ වැටලීම් සඳහා ක්ෂේත්‍රයට වැටලීම් පිරිස් යැවීමේ දී දෙපාර්තමේන්තුවට දරන්නට සිදුවිය හැකි වියදම් පියවීම.

මෙම අරමුණු ඉටුකිරීම සම්බන්ධව වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) නිලධාරීන්ගේ පුහුණු සහ අධ්‍යයන කටයුතු සඳහා සැලැස්මක් අනුමත කර ගැනීමකින් තොරව එම කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.**2,500,000** ක් වෙන් කර තිබුණද කිසිදු පුහුණු කටයුත්තක් සංවිධානය කර නොතිබීම නිසා එම මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. ඉකුත් වර්ෂයේදී මෙම කාර්යය සඳහා අනුමත වී තිබුණු ප්‍රතිපාදන වලින් සියයට **52**ක් ඉතිරි වී තිබුණි.

(ආ) අරමුදලේ අරමුණු වන ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා හෝ විශේෂ පිළිගැනීම් යනාදී කටයුතුවලට ගෙවීම සඳහා රු.**200,000** ක මුදලක්ද, පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු.**50,000** ක මුදලක්ද වෙන්කර තිබු අතර මෙම වෙන් කිරීම් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. ඒ අනුව අරමුදලේ අරමුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඇ) සුරාබදු කාර්මික අපරාධ වැටලීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තා අනුව **2014, 2015, 2016** සහ **2017** වර්ෂවල සිදුකර ඇති වැටලීම් සංඛ්‍යාව පිළිවෙලින් **1101** ක්, **387** ක්, **339** ක් හා **278** ක් ලෙස ක්‍රමික අඩුවීමක් නිරීක්ෂණය විය. **2016** වර්ෂයේදි නවක සුරාබදු පරීක්ෂකවරු **48** දෙනෙකු සහ සුරාබදු නියාමකවරු **92** දෙනෙකු බඳවා ගෙන තිබුණද කාර්මික වැටලීම් සංඛ්‍යාවේ වර්ධනයක් නිරීක්ෂණය නොවීය.

(ඈ) අංක **03/2011** දරන කාර්මික අපරාධ සම්බන්ධයෙන් වූ සුරාබදු චක්‍රලේඛය ප්‍රකාරව සමථ ගාස්තු අය කිරීම් පරාසය අනුව සමාලෝචිත වර්ෂයේ මුළු ග්‍රහණ සිද්ධි (වැටලීම්) සංඛ්‍යාවෙන් සියයට **79** ක ප්‍රමාණයක් සාමාන්‍ය වැරදි සම්බන්ධයෙන් වූ අතර ප්‍රධාන ගණයේ කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් එම ප්‍රමාණය සියයට **21** ක පමණ අඩු අගයක් සමාලෝචිත වර්ෂයේදී අනාවරණය කර ගෙන තිබුණි. ඒ අනුව ප්‍රධාන ගණයේ කොන්දේසි කඩ කිරීම් වැටලීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර නොමැති බව විගණනයේදී අනාවරණය විය.

(ඉ) කාර්මික අපරාධ මැඩලීම් සඳහා සහභාගී වන නිළධාරීන් දිරිමත් කිරීම සඳහා ත්‍යාග මුදල් ලබා දීම මෙම අරමුදලේ පරමාර්ථය වුවද , සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ දෙක තුළදී වැටලීම් සඳහා සෘජුව දායක වන නිළධාරීන් සඳහා සියයට 25 කට අඩු ප්‍රතිශතයක්ද සෘජුව දායක නොවන නිළධාරීන් සඳහා සියයට 39 ක පමණ ප්‍රතිශතයකින්ද ත්‍යාග මුදල් ගෙවා ඇති බව ත්‍යාග ගෙවීම් රටාව අධ්‍යයනය කිරීමේදී නිරීක්ෂණය විය.

(ඊ) අරමුදලේ වාර්ෂික ලැබීම් වලින් සියයට 15 ක ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර තවත් සියයට 10 ක් අරමුදල තුළ රඳවා ගත යුතු වේ. ශේෂ වී ඇති සියයට 75 ක කොටසින් සියයට 10 ක ප්‍රමාණයක් තොරතුරු සපයන්නන්ට තෑගි මුදල් බෙදා දීම් සඳහා වෙන් කිරීම වාර්ෂිකව සිදු කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂ 3කදී එසේ වෙන් කර තිබුණු මුදලින් තොරතුරු සපයන්නන් සඳහා කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ තුනක ලැබීම් හා ගෙවීම් ගිණුමේ ශේෂය ක්‍රමික වර්ධනය වීමක් දක්නට ලැබුණු අතර අරමුදල පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වූ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදාව වැඩි කිරීම සඳහා එම අරමුදල් උපයෝජනය නොකිරීම තුලින් අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | (රු) |
| 2017 | 388,502,891 |
| 2016 | 362,998,739 |
| 2015 | 330,559,626 |
| 2014 | 258,943,440 |

(ඌ) 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද අනුව ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තෑගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "සුරාබදු තෑගි" අරමුදලින් සුරාබදු නිලධාරීන්ට මෙන්ම, තොරතුරු සපයන්නන්ට ද සහ වෙනත් පාර්ශවයන්ටද, තෑගි ගෙවීම් සඳහා වූ අනුමත ලිඛිත ක්‍රමවේදයක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ආ) 1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව වාර්ෂිකව සමථ ගාස්තු ලැබීම් වලින් සියයට 10 ක් අරමුදලේ කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීම සඳහා අරමුදලේ රඳවා තබා ගත යුතු වුවද එසේ රඳවා ගත් මුදල් අරමුදලේ කාර්යයන් සඳහා යෙදවීම සියයට 47 කට වඩා අඩු මට්ටමක පැවති බව ඉකුත් වර්ෂ කිහිපයක දත්ත පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

(ඇ)ස්ථාවර වත්කම් වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය කරනු ලබන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ ඇති ක්ෂය සංචිත අරමුදලට බැර කරනු ලබන අතර 2017 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ රු. 44,185,902 ක මුදලක් පැවතුනද එම අරමුදල් ඵලදායී කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අරමුදල සතුව පුස්තකාලයක් නොතිබියදී අරමුදලින් මිලදී ගෙන තිබූ රු.221,524 ක් වූ පුස්තකාල පොත් තොගය වසර 05 කට අධික කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **අයවැය ලේඛනමය පාලනය**

අයවැය ගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා අතර වැය විෂයන් 7 කට අදාලව සියයට 25 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම සහ පොත්පත් පවත්වාගෙන නොතිබීම. |
| (ආ) වත්කම් පාලනය | විධිමත් පරිදි ලේඛන පවත්වා නොතිබීම සහ භෞතික සමීක්ෂණ නොපැවැත්වීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | අංක 818 සුරාබදු නිවේදනය ප්‍රකාරව ඇතැම් කාර්යයන් ඉටුකර නොතිබුණු අවස්ථා පැවතීම. |